විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍ය

# විද්‍යාවේ පෙරගමන්කරු

විද්‍යා ප්‍රබන්ධ ලේඛකයන් හැම විට ම වාගේ විද්‍යාඥයන්ට වඩා ඉදිරියෙන් සිටින බව පෙනී යන වැදගත් කරුණකි. මීට හොඳ නිදසුනක් නම්, මීට සියවසකට පමණ පෙර ජීවත් වූ ජූල්ස් වර්න් නම් වූ ප්‍රංශ විද්‍යා ප්‍රබන්ධකරු ය. ඔහු, හඳට ගිය ගමනක් ගැන විද්‍යා ප්‍රබන්ධයක් 1855 වසරේ දී ලියා පළ කළේ ය.

ආර්.බී. අතපත්තු

විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යයක් නොවිණි නම් මිනිසාගේ අභ්‍යවකාශ ගමන් වසර 15 වසකින් ප්‍රමාදවීමට ඉඩ තිබිණැයි 1979 දී පැවැති විද්‍යා ප්‍රබන්ධ ලේඛකයන්ගේ සහ ගගනගාමීන් ගේ සමුළුවක දී සෝවියට් ගගනගාමී ජෝර්ජ් ග්‍රෙච්කෝ ප්‍රකාශ කොට ඇත. විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යය පිරික්සීමේ දී එය මැනැවින් පෙනී යයි. එපමණක් නොව විද්‍යා ප්‍රබන්ධ ලේඛකයන් හැම විට ම වාගේ විද්‍යාඥයන්ට වඩා ඉදිරියෙන් සිටිත බවද එහි දී පෙනී යන තවත් වැදගත් කරුණකි.

මීට හොඳ නිදසුනක් නම්, මීට සියවසකට පමණ පෙර ජීවත් වූ ජූල්ස් වර්න් නම් වූ ප්‍රංශ විද්‍යා ප්‍රබන්ධකරු ය. ඔහු වෙනත් ප්‍රබන්ධ ද කරමින් හඳට ගිය ගමනක් ගැන ද 'Form the Earth to Moon' නම් වූ විද්‍යා ප්‍රබන්ධයක් 1855 වසරේ දී ලියා පළ කළේ ය.

ඊට සියවසකට වඩා අධික කාලයකට, පසු 1969 දී අමෙරිකා එක්සත් ජනපදයේ නාසා ආයතනය මිනිස් ඉතිහාසයේ ප්‍රථම වරට මිනිසුන් තිදෙනකු හඳට යැවූහ. ඉන් දෙදෙනෙක් හඳට ගොඩ බැස, ඔවුන්ගේ පිය සටහන් හඳමත තැබූහ.

මේ ගමන් දෙක සිදු කෙරුණු කාලය සහ පරිසරය සපුරා වෙනස් ය. එසේත් ඒ ගමන් දෙකේ පවත්නා සාමානතාව පුදුම එළවන සුළු ය.

එය වඩාත් පුදුම විය යුතු වන්නේ එකක්, විද්‍යාව නොදියුණු දහනව වැනි සියවසේ මුල් භාගයේ මනඃකල්පිතයක් වීමත්, අනෙක විද්‍යාව බෙහෙවින් දියුණු විසිවැනි සියවසේ මැදත් සිදු වූ සැබෑ සිද්ධියක් වීමත් ය.



ජූල්ස් වර්න්

ඇපලෝ - II යානය හඳ මගට යොමුකළ සැටර්න්-V රොකටය ගුවන් ගත කෙරුණේ, ෆ්ලොරිඩාවේ කැනවරල් නොහොත් කෙනඩි තුඩුවෙනි. වර්න් ද සිය ප්‍රබන්ධයේ යානය වූ කේතුවාකාර සිලින්ඩර් ප්‍රේක්ෂකයා (Cilindro Conical Projecticle)හඳට විදින ලද්දේ එම ස්ථානයට ම මඳක් දුරිනි. එනම්, තම්පෝ නම් වූ ස්ථානයකිනි. ඒ පිහිටි ස්ථානය වූයේ වර්තමාන අභ්‍යවකාශ තොටුපළට කිලෝමීටර 225 ක් නුදුරෙනි. එසේ ම ඇපලෝ යානය පොළෝ කක්ෂයෙන් මිදී හඳ මගට පිවිසීමට සත්‍යවශයෙන් ම පැයට සැතපුම් 38,720 ක ප්‍රවේගයකට ත්වරණය විය යුතු විය. වර්න් ද මෙම මිදුම් ප්‍රවේගය පැයට සැතපුම් 40,000 ක් වශයෙන් දක්වනුයේ, නිව්ටන් ගේ ගුරුත්වාකර්ෂණ න්‍යායයේ සමීකරණයන් මැනවින් හැදරූ භෞතික විද්‍යාඥයකු විලසිනි. ඔවුන්ගේ සිරුරවල කිසි ම බරක් නොමැති බව ඔවුන්ට දැනෙන්නට විය. ඔවුන්ගේ දෑත් නව දූරටත් සිරුරු දෙපසින් පහළට එල්ලී නොතිබිණ. දෙපා බිමින් එසැවී බිම නොගැවී පැවැතිණ. හිස් උරිස් මත චලනය වෙමින් පැවැතිණ. ඒ වර්න්ගේ හඳගාමීන් හඳ ගමනේ දී අත් දුටු අත්දැකීම් වර්න් දක්වන අයුරින් සිය විද්‍යා ප්‍රබන්ධය ලියන විට, සර් අයිසෙක් නිව්ටන්ගේPrincipiaපළවී බොහෝ කල් ය. එහෙයින් නිව්ටන් ලොවට ලබා දුන්, ගුරුත්වාකර්ෂණය පිළිබඳ දැනුම උපයෝගී කොට ගෙන සිය මනඃකල්පිත හඳගමන වර්න් සැලැසුම් කළේ යැයි සිතිය හැකි ය. වර්න්ගේ හඳගාමීන් දුටු බරේ සැහැල්ලුතාවක් දැනීම වර්තමාන අභ්‍යවකාශ ගමන්වල දී වර්තමාන අභ්‍යවකාශගාමීන් ද අත්දැක ඇති සත්‍යයකි.

අභ්‍යවකාශ ගමන්වලින් පසු පෙරළා පොළොවට බැසීම ක්‍රම දෙකකට කෙරෙයි. සෝවියට් දේශය ඒ සඳහා යොදා ගත්තේ ගොඩබිම ය. නාසා සිය අභ්‍යවකාශ යානා බැස්සුයේ මුහුදට ය. වර්න් ද සිය යානය මුහුදට පහත් කොට හඳගාමීන් ඔරු මගින් ගොඩබිමට රැගෙන ආයේ ය. ජූල්ස් වර්න් නම් වූ මේ විස්මකුරු විද්‍යා ප්‍රබන්ධකරු විද්‍යාඥයන්ට වඩා ඉදිරියෙන් සිටියේ සුළුපටු කාලයකින් නොවේ. සිය වසකට ද වඩා දීර්ඝ කාලයකිනි.

විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍ය ගැන තවදුරටත් විමැසීමට පෙර, විද්‍යා ප්‍රබන්ධ පිළිබඳ නිර්වචනය කුමක්දැයි සෝදිසිකොට බැලීම වැදගත් වේ. එය කිහිප විධියකින් විවිධ විචාරකයෝ අර්ථකථනය නිර්වචනය කැර ඇත. විද්‍යා ප්‍රබන්ධ හුදෙක් විද්‍යාව සමඟ කිසියම් සම්බන්ධයක් ඇති ප්‍රබන්ධ විශේෂයක් බව නම් අපි දනිමු. එහෙත් ඒ සම්බන්ධය කොතෙක් දුර පවත්නා එකක් ද? විද්‍යා ප්‍රබන්ධකරුවකු සහ විචාරකයකු වන කිංස්ලි අමිස් සිය 'New Maps of Hell' හි දක්වා ඇති හැටියට විද්‍යා ප්‍රබන්ධයක් යනු 'විද්‍යාවේ සහ තාක්ෂණයේ නව ප්‍රවණතාවන් (සොයාගැනීම් සහ නිපැයුම්) ආශ්‍රයෙන් ගෙතුණු කතාවකි. එහෙත් ඊට වඩා වැඩියමක් විද්‍යා ප්‍රබන්ධයකින් සිදුවිය යුතුයැයි මේ ලියන ලේඛකයා විශ්වාස කරයි. අමිස් කියන පරිදි, නව සොයාගැනීම් හෝ, නිපැයුම් හෝ වටා කතාව ගොඩනැගිය යුතු බව ඇත්ත ය. එහෙත් ඒ මගින් ලේඛකයා අනාගතයට සිය කතාව ප්‍රක්ෂේපණය කළ යුතු වෙයි. එය සුභවාදී හෝ අසුභවාදී හෝ විය හැකි ය. සුභවාදී නම් එය සමාජයේ ප්‍රවර්ධනයට හේතු වන අතර අසුභවාදී නම් ඉන් වැළැකීම සඳහා අවස්ථාවක් ඒ ගැන කල්තියා දැනුවත්වීමෙන් සමාජයට ලැබෙනු ඇත.

බොහෝ විට, විද්‍යා සොයාගැනීම් මෙන් ම, නව නියැපුම් ද වාසිදායක මෙන් ම අවාසිදායක ගුණයන්ගෙන් යුක්ත වෙයි. විසි වැනි සිය වසේ මුල්භාගයේ දී සොයා ගැනුණු 'න්‍යෂ්ටිකදම්ක ප්‍රතික්‍රියාව' අද්‍යතන යුගයේ මිනිසාගේ වාසියට මෙන් ම අවාසියට ද හේතු වී ඇත. මෑතකදී ජාන විද්‍යාවේ කෙරුණු ක්ලෝනීකරණ පරීක්ෂණ මිනිසාගේ ජීව විද්‍යාත්මක ගැටළු රැසකට විසඳුම් ලබාගත හැකි DNA ගැටළුව විසඳීමට බෙහෙවින් තුඩුදිය හැකි ය.



**වර්න් ගේ යානයේත්, ඇපලෝ - ii හැඩය කොතරම් සමාන දැයි මෙම රූපයෙන් පෙනේ**

එහෙත් ක්ලෝනීකරණයෙන් මිනිසකු බිහිකළහොත් ඒ තවත් 'ෆ්‍රැන්කෙනස්ටීන්' කෙනෙකු නොවිය හැකි ද? (මේ ගැන විස්තර මතු දක්වේ) බොහෝ විචාරකයන් විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍ය සඳහා නිර්වචනයක් සැපයීමේ දී එහි ආකෘතිය (form)ගැන නොසලකා අන්තර්ගතය(Content)ගැන පමණක් සලකන බව'Billian year spree'හිසින්, විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍ය පිළිබඳ ග්‍රන්ථයක් ලියන බ්‍රියන් අල්ඩිස් නම් විද්‍යා ප්‍රබන්ධ ලේඛකයා සිය ග්‍රන්ථයේ සඳහන් කරයි. ඔහුගේ නිර්වචනය අනුව 'විද්‍යා ප්‍රබන්ධ යනු අති උසස් සහ ව්‍යාකූල වූ දැනුම අනුව (විද්‍යා දැනුම) ගොතික(Gothic) සහ පශ්චාත් ගොතික ආකෘතියක් මත මිනිසාට විශ්වයේ ඇති තැන සහ ඔහු පිළිබඳ නිර්වචනයක් සැපයීමෙති.' කෙසේ වුවද, විද්‍යා සහ තාක්ෂණ ක්ෂේත්‍රයන් හි ප්‍රවර්ධනය සහ ඒවායේ අතුරුඵල මුලින් ම සමාජයට සංනිවේදනය කෙරෙන නවීනතම සාහිත්‍යාංගයක් බවට විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යය හඳුන්වා දිය හැකි ය.

විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යයේ ඉතිහාසය හුදෙක් අවකාශය(Space) සහ කාලය (Time)පිළිබඳ මිනිස් ආකල්පවල පරිණාමයේ ඉතිහාසය යි. එනම් මිනිසා විශ්වය පිළිබඳ වූ මිත්‍යා මතවලින් බැහැරවෙමින් එහි යථා ස්වභාවය හඳුනා ගැනීමත්, ඔහුට එහි ඇති තැනත් පිළිබඳ ඉතිහාසය යි. මිනිසාගේ ප්‍රබන්ධ සාහිත්‍ය මිත්‍යා අදහස් පදනම් වී ආරම්භ වුවද විශ්වය පිළිබඳ ඔහුගේ දැනුම වැඩෙත් ම ඒවා තාත්වික නොහොත් යථාර්ථවාදී ස්වරූපයක් ගැනෙන්නට විය. ඒ අනුව දේවකතා සුරංගනා කතා ප්‍රමුඛ මිත්‍යා කතාවලට සීමා වී තුබූ ප්‍රබන්ධ සාහිත්‍ය දහ අට වැනි සහ දහනව වැනි සියවස්වල දී වඩ වඩාත් තාත්වික ස්වරූපයක් ගැනුණේ ය. එනෙක් අද්භූත හැඟීම්වලින් පාඨකයා මෝහනය කළ ප්‍රබන්ධකරුවෝ, ඊ.එම්. ෆෝස්ටර් සිය Aspects of the Novel හි සඳහන් කරන පරිදි 'ජීවිතය නම් මෙබඳුය' යනුවෙන් කතා ලිවීමට වන්හ. එහෙත් අද්භූත කතා සාහිත්‍යයෙන් බැහැර නොවී ය. එනෙක් වූ අද්භූත කතා සාහිත්‍යයේ තැන තාත්වික කතා සම්ප්‍රදාය ගත් පසු, අද්භූත කතා එම ප්‍රධාන සාහිත්‍ය ධාරාවේ ම එක් කොටසක් ව පමණක් පවතින්නට විය.



**අයිසෙක් ඇසිමෝ**



**ආතර් සී. ක්ලාක්**

විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍ය බිහිවූයේ ප්‍රධාන සාහිත්‍යධාරාවෙන් වියුක්ත වූ ඒ අද්භූත සාහිත්‍යාංගයෙනි. බොහෝ විට මෙම සාහිත්‍යය මනඃකල්පිත චාරිකා හෝ, 'සකලසිරින් පිරි' පරමාදර්ශී දේශයකට පාඨකයා මොහොතකට ගෙනයමින් හෝ ලියූ කතා ය. ජොනතන් ස්විෆ්ට් ගේ'Gulliver's Travel – 1726'කෘතියේ මෙම තේමාවන් දෙක ම දක්නා ලැබේ. ස්විෆ්ට් ට වසර 200 කට පමණ පෙර වුසූ, තෝමස් මෝ ගේ Utopiaදෙවැනි සියවසේ සමෝසයේ සිටි ලූෂියන්ගේ True Historyසහ ක්‍රිස්තෝදයට පෙර සිව්වැනි සියවසේ සිටි ප්ලේටෝ ගේ The Republic විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යයේ ප්‍රභවයන් ලෙසට ඇතැම් විට සැලැකේ.Science Fiction Robert Scholes & Eric S Rabkin)එහෙත් වර්තමාන විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍ය කෙරේ තදින් බල පෑ ලෝකප්‍රකට ලේඛක ලේඛිකාවෝ කිහිප දෙනෙක් වෙති. ඔවුන් අතුරින් එංගලන්තයේ මේරි ෂෙලී, ඇමරිකා එක්සත් ජනපදයේ එඩ්ගා ඇලන් පෝ (1809-49) ප්‍රංශයේ ජූල්ස් වර්න් (1828-1905) ඇමරිකා එක්සත් ජනපදයේ එඩ්වර්ඩ් බෙලමි (1850-98), එංගලන්තයේ එච්.ජී. වෙල්ස් (1866- 1946) සහ අමෙරිකා එක්සත් ජනපදයේ එඩ්ගා රයිස් බරෝස් (1857-1950) මෙහිලා මුල් තැනක් ගැනෙයි.

විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍ය පිළිබඳව බ්‍රියන් අල්ඩිස් ගේ නිර්වචනයෙන් හෙළිවන ප්‍රධාන කරුණ නම්, විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යයේ ආකෘතිය අනුව ඊට උරුම වී ඇති කතා සම්ප්‍රදාය යි. එනම් එදත්, අදත් ඉතා ජනප්‍රිය අද්භූත ප්‍රබන්ධ සම්ප්‍රදාය යි. මෙම අද්භූත ප්‍රබන්ධ සම්ප්‍රදාය ආරම්භ වූයේ ඉහත සඳහන් කළ පරිදි දහ අටවැනි සියවසේ දී වූ අවකලනය නිසා ම නොව, එම සියවසේ ආරම්භ වූ රොමාන්ටික ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් වශයෙනැයි කියන විචාරකයෝ ද සිටිති. ඔවුන් අනුව ප්‍රධාන සාහිත්‍ය ප්‍රවාහයේ සම්භාව්‍ය නොවන කොටස් හැඳින්වීම සඳහා අද්භූත ගණයට වැටෙන සාහිත්‍ය

ගොතික නමින් හැඳින්වෙන්නට වූ බවයි. අද්භූත ප්‍රබන්ධ අයත් වන මෙම සාහිත්‍ය සම්ප්‍රදාය අද පොදු පාඨකයා අතර ඉතා ජනප්‍රියව ඇති බව විද්‍යා රහස්පරීක්ෂක, චාරිකා, වරපුරුෂ සේවා ආදී යටතේ පළවන අප්‍රමාණ කෘතීන් ගෙන් පෙනී යයි.

පැරණි නවකතාකරුවන් බොහෝ දෙනෙක් මේ ගොතික සම්ප්‍රදායට අයත් වෙති. 1764 ලියැවුණු, හොරස් වල්පොල ගේ 'Castel of Otranto' නම් කෘතිය මෙම සම්ප්‍රදායේ පැරණිම කෘතිය ලෙස සැලකේ. මෙම සම්ප්‍රදාය ආරම්භයේ දී ඒ ජනප්‍රිය කැරවීමෙහිලා ඈන් රැඩ්ක්ලිෆ් ගේ'The Mysteries of Udoipho'නම් නවකතා පහ හේතු භූත විය. පසු කලෙක ලියැවුණු සර් වොල්ටර් ස්කොට්, චාලට් බ්‍රොන්, එඩ්ගා ඇලන් පෝ ප්‍රමුඛ ලේඛක ලේඛිකාවෝ මෙම සම්ප්‍රදායේ ආදිතමයෝ වූහ.'Science Fiction'නොහොත් විද්‍යා ප්‍රබන්ධ යන ව්‍යවහාරය මුලින් ම මෙම කතාවලට යෙදී ඇත්තේ, ස්කොට් ජාතික කිවියකු වූ තෝමස් කැම්ප්බෙල් විසින් 1851 දී 'Poetry of Science'යටතේ ලියන ලද ලිපියක ය. ඊට පසු 1927 දී'Amazing stories'නම් සඟරාවේ කර්තෘ වාක්‍යයට එවූ පිළිතුරු ලිපියක 'The Magazine of Scientification' යනුවෙන් එම පාඨකයා යොදා තිබිණ. ඉන් පසු එයScience Fictionයනුවෙන් ව්‍යවහාරයට ආයේ 1929 දී හියුගෝ ජෙනස්බැක් විසින් ආරම්භ කළ 'Science Wonder Stories' නම් සඟරාවෙන් බැව් කියනු ලැබේ.

ද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යය බොහෝ විචාරකයන් සිතන පරිදි ප්‍රධාන සාහිත්‍ය ධාරාවෙන් වියුක්තව ස්වාධීනව පවත්නා සාහිත්‍යාංගයක් ම නොවේ. අද්‍යතන යුගයේ ප්‍රබල සාහිත්‍යාංගයක් වන නවකතාවේ ම විකාශනයක් හැටියට විද්‍යා ප්‍රබන්ධ හැඳින්විය හැකි ය. එහෙත් එය අද්භූත ගණයට ඇති නැකම අත් නොහැර නව ම පවත්නා බව කිව යුතු ය. නවකතා වර්ගීකරණයේ දී අද්භූත, තාත්වික හා ඓතිහාසික වශයෙන් වර්ගීකරණය කිරීමට විචාරකයෝ කැමැති වෙති. මින් පළමු ගණය වන අද්භූත නවකතා ගණයට විද්‍යා ප්‍රදන්ධ අයත් වන බව ඉතා පැහැදිලි ය. විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යයේ මුල් ම කෘතිය ලෙස සැලකෙන දහනව වැනි සියවසේ පළවූ මේරි ෂෙලීගේ 'ෆ්‍රැන්කෙන්ස්ටීන්' නම් කෘතියත්, අද පළ වන ඕනෑම විද්‍යා ප්‍රබන්ධයකුත් ගැන විමසා බැලීමේ දී අද්භූත නවකතාවට විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යයේ ඇති නැකම පෙනී යනු ඇත.



එඩ්ගා රයිස් බරෝස්



මේරි ෂෙලී

දහසයවන සියවසේ ආරම්භ වූ කාර්මික විප්ලවය නිසා ලෝකයේ එතෙක් පැවැති මති මතාන්තර බෙහෙවින් විමර්ෂණයට භාවිතය වී තිබිණ. විශේෂයෙන් කාර්මික විප්ලවයට තුඩු දුන් විද්‍යාව මෙහිලා ක්‍රියාකාරී වූ ප්‍රධාන සාධකය විය.

ශ්‍රේෂ්ඨ ඉංග්‍රීසි කිවියකු වූ පී.බී. ෂෙලී විසි දෙවැනි වියේ දී, මේරි වුල්ස්ටෝන්ක්‍රාෆ්ට් ගොඩ්වින් නම් වූ දහනව වියැති යුවතිය සමඟ ප්‍රේම සම්බන්ධයක් ඇතිකැර ගෙන තිබිණ. ෂෙලී ඒ වන විටත් විවාහක පුද්ගලයෙකි. එහෙයින් ඔහුට 1816 දී සිය පෙම්වතිය සමඟ ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවරට පැන යාමට සිදු විය. තවත් සමකාලීන ශ්‍රේෂ්ඨ කිවියකු වූ ලෝඩ් බයිරන් ඔවුන්ට ජිනීවා විල් තෙර එක් සැඳෑවෙක දී හමුවිණ. ඔව්හු ඒ සුන්දර සැන්දෑවේ කාව්‍ය නිර්මාණය සහ සමකාලීන නවකතාව පිළිබඳ කතාබහ කළහ.

ඒ වන විට, දහසයවන සියවසේ ආරම්භ වූ කාර්මික විප්ලවය නිසා ලෝකයේ එතෙක් පැවැති මති මතාන්තර බෙහෙවින් විමර්ෂණයට භාවිතය වී තිබිණ. විශේෂයෙන් කාර්මික විප්ලවයට තුඩු දුන් විද්‍යාව මෙහිලා ක්‍රියාකාරී වූ ප්‍රධාන සාධකය විය. එහෙත් එද සොයාගෙන තුබූ ඇතැම් විද්‍යා සොයාගැනීම් හුදෙක් සත්‍යයැයි පෙනෙන්නට තුබූ සිද්ධාන්තික අවස්ථා පමණි. ලෝහ වර්ග දෙකක් ස්පර්ශ කිරීමෙන් ඒවා ඇඹරවිය හැකි බව ඉතාලි ජාතික ලූගී ගල්වානි විසින් 1791 දී සොයාගෙන තිබිණ. ඒ අනුව ජීවී පටක 'සත්ත්ව විද්‍යුතයෙන් පිරී ඇති බව ඔහු නිගමනය කොට තිබිණ. ඊට එරෙහි වූ තවත් ඉතාලි ජාතික භෞතික විද්‍යාඥයකු වූ ඇලෙක්සැන්ඩ්‍රෝ වෝල්ටා ලෝහ දෙකක් සමීපව තැබීමෙන්, විද්‍යුත් ධාරාවක් නිපදවෙන බවත්, ඊට ජීවීන් හෝ ජීව ද්‍රව්‍යවල හෝ සම්බන්ධයක් නැති බවත් පෙන්වා දුන්නේ ය. අනතුරුව වෝල්ටා විසින් ප්‍රථම බැටරිය නිපදවන ලදී. 1807 සහ 1808 දී ඊට වඩා ප්‍රබල බැටරියක් නිපදවූ හම්ප්‍රි ඩේවි නම් වූ ඉංග්‍රීසි ජාතික රසායන විද්‍යාඥයා විද්‍යුතයෙන් තොරව කළ හැකි රසායනික ප්‍රතික්‍රියා රැසක් ම කැර පෙන්වී ය. සමකාලීන මෙම විද්‍යා සොයා ගැනීම් ගැන වියනා විල්තෙරැ දී හමු වූ කවීන් දෙදෙනා සහ මේරි දිගින් දිගට ම කථාබහ කළහ. අන්තිමේදී විද්‍යුතය යෙදීමෙන් ජීවය නිර්මාණය කිරීමේ හැකියාව ගැන ඔව්හු උපකල්පනය කළහ.

මේරි ෂෙලීට Frankensteinකතාව ලිවීමෙ හිලා බල පෑ තවත් සාධකයක් නම්, පරිණාමවාදයේ පුරෝගාමියා වශයෙන් සැලකෙන චාර්ල්ස් ඩාවින්ගේ සීයා වූ ඉරැස්මස් ඩාවින් (1731-1802) විසින් පරිණාමය පිළිබඳව පළකොට තුබූ මූලික මත ය. ඔහුZoonomiaනම් ග්‍රන්ථයෙන් ඒ මතය පළ කොට තිබිණ. ඩාවින්ගේ ඒ මතය බයිබලයේ වූ නිර්මාණවාදයට එරෙහි විය. දෙවියන් විසින් කෙරුණු මැවීමේ කාර්යයේ අගය ඉන් බොහෝ දුරට අඩු කෙරිණ. මැවීමේ කාර්යය හුදෙක් දෙවියන්ට පමණක් නොව, මිනිසාට ද කළ හැකි දෙයක් බව පෙන්වමින් මේරි සිය කතා නායකයා වූ වික්ටර් ෆ්‍රැන්කෙන්ස්ටීන් වෙත පවරමින් සිය කතාව ගෙතුවා ය. එසේ නම්, සිය කතාවේ දූවැත්තයා නිර්මාණය කිරීම සඳහා ඉරැස්මස් ඩාවින්ගේ පරිණාමය පිළිබඳ අදහස් සහ සමකාලීනව විද්‍යුතය පිළිබඳ සොයා ගැනීම් ද මේරි ෂෙලීට උපයෝගී වූවා නිසැක ය.

යෞවනයේ උපයෝගී ගුණයෙන් ප්‍රමුදිතව සිටි මේරි, මෙම විෂය පදනම් කරගෙන එකල මෝස්තරයක් ව පැවැති අද්භූත කතාවක් ලියුවහොත් කොහොමදැයි ප්‍රශ්න කළා ය. බයිරන් සහ ෂෙලී එය අනුමත කළහ. එපමණක් නොව තිදෙනා ම එවැනි කතා තුනක් ලිවි යුතු යැයි කථා කැර ගත්හ. එහෙත් අන්තිමේදී කතාවක් ලියූයේ මේරි විසින් පමණි. (අයිසෙක් ඇසිමෝ)

1816 අවසානයේ දී ෂෙලීගේ බිරිඳ දියේ ගිලීමෙන් සිය දිවි හානි කර ගත්තා ය. ඉන් පසු එංගලන්තයට පෙරළා පැමිණි ෂෙලීට සා මේරිට විවාහවීමට බාධකයක් නොවූයෙන් ඔව්හු විවාහ වූහ.

මේරි ෂෙලී සිය 'අද්භූත විද්‍යා කතාව' 1818 දී ලියා අවසන් කළා ය.

මේරි එද ලියූ ඒ අද්භූත විද්‍යා කතාව හුදෙක් නව නිපැයුමක් කරන වික්ටර් ෆ්‍රැන්කෙන්ස්ටීන් නම් තරුණ විද්‍යාඥයකු පිළිබඳ ශෝචනීය කතාවකි.

එම තරුණ විද්‍යාඥයා ව්‍යවච්ඡේද විද්‍යාව පිළිබඳ ශිෂ්‍යයෙකි. ඔහු මිනිස් අඟ පසඟ එකතු කොට, මිනිසෙකු නිර්මාණය කොට විද්යුතය මාර්ගයෙන් ඔහු පණ ගන්වයි. අඩි අටක් උස එම දැවැන්තයා රුදුරු පෙනුමෙන් යුත් එකෙකි.

වික්ටර් නිර්මාණය කළ දැවැන්තයාට සමාජයේ තැනක් නොලැබෙයි. ඔහු විද්‍යාඥයාගේ මනාලිය ඇතුළු සමීප නෑසියන් විනාශ කොට කෙළවර විද්‍යාඥයා ද විනාශ කරයි. අන්තිමේදී දැවැන්තයාගේ විනාශය ද නොවැළැක්විය හැකි එකක් බවට පත් වේ.

ෆ්‍රැන්කෙන්ස්ටීන් නම් වූ එම අද්භූත විද්‍යා කතාව එදා මෙන් ම අදත් ලෝකය පුරා ම ජනප්‍රියව පවතී. එය කොතරම් ජනප්‍රියදයත් නිර්මාපකයා විනාශ කෙරෙන යම් නිපැයුමෙක් වේ නම් ඒ 'ෆ්‍රැන්කෙන්ස්ටීන්' යනුවෙන් හැඳින්වීම අද එදිනෙදා ව්‍යවහාරයට ද පත්ව ඇත.

මේරි ෂෙලීගේ ප්‍රබන්ධය අද්භූත කතා රාමුවෙන් බැහැර වී නැත. ඒ සඳහා පාදක කැර ගෙන ඇති විද්‍යා පසුබිම මෙතෙක් සනාථ වූ විද්‍යා සිද්ධාන්තයෙක් නොවේ. එහෙයින් අද්භූත අගයක් මිස විද්‍යාත්මක අගයක් එහි නොවන හෙයින් ෆ්‍රැන්කෙන්ස්ටීන් ප්‍රථම විද්‍යා ප්‍රබන්ධය ලෙස පිළිගැනීමට ඇතැම් විචාරකයෝ මැළි වෙති. එහෙත් එහි කතා වස්තුව ආතර් සී. ක්ලාක් ගේ 'හල්' නිර්මාණයේදීත් කාරල් කපෙක් සහ අයිසෙක් ඇසිමෝ වැනි විද්‍යා ප්‍රබන්ධකරුවන්ගේ රෝබෝ 'සංස්කෘති' නිර්මාණය කිරීමේදීත් ප්‍රබල ලෙස බලපා ඇත. එපමණක් නොව අපමණ සුළු විද්‍යා ප්‍රබන්ධකරුවෝ මෙම රාමුවෙන් බැහැර නොගොස් ඒ තුළම හිඳ දහසක් කතා මෙතෙක් ලියා ඇත. කොටින් ම අද විද්‍යා ප්‍රබන්ධ ක්ෂේත්‍රයේ ෆ්‍රැන්කෙන්ස්ටීන් සංකල්පය ආදර්ශ කතා වස්තුවක් බවට පත්ව ඇති බව පිළි ගත යුතුව ඇත. එහෙයින් මේරි ෂෙලී විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යයේ පියා වශයෙන් (මෙහිදී මව) නොසලකා නොසිටිය හැකි තත්ත්වයකි.

එසේ වුවද මේරි ෂෙලීට වසර 45 කට පසුව 'Five Weeks in a Ballon' (1863)ලියමින් විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍ය ක්ෂේත්‍රයට ප්‍රවේශ වූ ජූල්ස්වර්න් ද, වසර 77 කට පසු 'The Time Machine' ලියමින් විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍ය ක්ෂේත්‍රයට එක් වූ හර්බට් ජෝර්ජ් වෙල්ස් ද විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යයේ පියවරුන් හැටියට සැලකීමට ඇතැම් විචාරකයෝ සූදානම් වෙති. මොවුන් දෙදෙනාම මේරිට වඩා, වඩාත් විද්‍යාත්මක පසුතලයකින් යුතුව සිය කතා ලියූ නිසා, ඇයට වඩා බොහෝ ඉදිරියෙන් සිටින බව පෙනේ. එසේ වුවද විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යයේ නිර්මාතෘවරයා හැටියට මේරි ෂෙලී සැලැකීම සඳහා ඇයගේ කතා ආකෘතිය 'ආදර්ශ කතා වස්තුවක්' බවට පත්ව තිබීම ම ප්‍රමාණවත් යයි සිතමි.

විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍ය ආරම්භ වූ යුගයේ සිට මේ දක්වා ම විද්‍යා ප්‍රබන්ධකරුවන් අතර ජනප්‍රිය තේමාවක් වූ 'අභ්‍යවකාශ ගමන්' ගැන කතා ලිවීමේ පුරෝගාමීන් වූයේ වර්න් සහ වෙල්ස් බවට බොහෝ දෙනා විශ්වාස කරති.



**බර රහිතභාවයට මුහුණ දෙන වර්න් ගේ අශ්‍යවකාශගාමීහු**

1828 ප්‍රංශයේ නන්ටේස් නම් ප්‍රදේශයේ උපන් ජූල්ස් වර්න් ගේ ප්‍රථම විද්‍යාත්මක කතාව වූයේ Five Weeks in a Ballon' ය. ඊට පසු Journey of the Center of the Earth (1864), From the Earth to the Moon (1865) ආදී විද්‍යා ප්‍රබන්ධ කතා 80 ක් ම ලියන ලදී. ඔහුගේ මෙම කෘතීන් එදා සමකාලීන බොහෝ ලේඛකයෝ අනුකරණය කළහ. පැවැති අල්ප වූ විද්‍යා දැනුම ඔස්සේ අනාගතය දැකීමට ජූල්ස් වර්න් තුළ වූ අපූරු හැකියාව මෙම ලිපිය ආරම්භයේ දී දැක්වූ වර්න් ගේ මනඃකල්පිත හඳ ගමනක්, ඇපලෝ-IIයානයේ සැබෑ හඳ ගමනක් අතර වූ සාම්‍යතාවෙන් ස්ඵුට වෙයි.

විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍ය ආරම්භ වූ යුගයේ සිට මේ දක්වා ම විද්‍යා ප්‍රබන්ධකරුවන් අතර ජනප්‍රිය තේමාවක් වූ 'අභ්‍යවකාශ ගමන්' ගැන කතා ලිවීමේ පුරෝගාමීන් වූයේ වර්න් සහ වෙල්ස් බවට බොහෝ දෙනා විශ්වාස කරති. එහෙත් අභ්‍යවකාශ ගමන් පිළිබඳ තාක්ෂණය ගැන සිහිනවත් නොදුටු දෙවැනි සියවස තරම් ඈත අතීතයේ ග්‍රීසියේ සමෝස් හි ජීවත් වූ ලූෂියන් නමැති ලේඛකයා හඳ ගමනක් ගැන True Historyනමින් කතාවක් ලිවී ය. තාරකා විද්‍යාඥයකු ද මේ අතර 1634 දී Somnium නමින් හඳ ගමනක් ගැන කතාවක් ලිවී ය. ඔහු නම් ග්‍රහලෝක චලනය පිළිබඳ මූලික න්‍යායයන් තුන ඉදිරිපත් කළ ජර්මානු ජාතික ජොහැන්නස් කෙප්ලර් ය. එහෙත් ඔහු සිය අභ්‍යවකාශාමීන් සඳට යැවීම සඳහා උපයෝගී කොට ගත්තේ විද්‍යා බලය නොව විජ්ජා බලය යි. කෙප්ලර් ජීවත් වූයේ විද්‍යාවට වඩා ගුප්ත විද්‍යාව දැඩි ලෙස විශ්වාස කළ යුගයක වීම ඊට හේතු වූවා විය හැකි ය.

අභ්‍යවකාශ ගමන් සඳහා රොකටය වැනි වාහනයක් මුලින් යොදා ගැනුණේ සයිරනෝ ද බශ්‍රැක් 1656 දී ලියූ Voyages to the Moon and Sunකතාවෙනි. ඔහුගේ රොකටය ජෙට්යානයකට සමාන විය. ඉදිරිපසින් වාතය ඇතුළු වී ප්‍රවේගය ඇති කොට පිටුපසින් පිට වන සේ එම රොකටය සැලසුම් කොට තිබිණ. අභ්‍යවකාශයේ වාතය නොමැති බව බශ්‍රැක් නොදැන සිටි සෙයකි. 1638 ෆ්‍රැන්සිස් ගොඩ්පත් නම් බිෂොප්වරයා විසින් ලියන ලද The Man in the Moone නම් කතාවේ ගුරුත්වාකර්ෂණය පිළිබඳ අදහසක් ගැබ්ව තිබිණි. එහෙත් ගුරුත්වාකර්ෂණය පිළිබඳ නියමයන් නිව්ටන් විසින් ලොවට හඳුන්වා දුන්නේ ඊට අඩසිය වසකට පමණ පසු, 1687 දී ය. පසුව විල්කින් බිෂොප්වරයා, වෝල්ටෙයාර් ආදීහු ද අභ්‍යවකාශ ගමන් පිළිබඳ කතා ලියූහ. මොවුන්ගෙන් ජූල්ස් වර්න් දර්ශනයට ආයේ 1865 දී ය.

## විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යයේ පියා

වශයෙන් ඇතැම් විචාරකයෝ සැලැකීමට කැමැති වන එච්.ජී. වෙල්ස් උපන්තේ වර්න්ට වසර 38 කට පසු එංගලන්තයේ ය. බොහෝ විචාරකයන් වෙල්ස් හඳුන්වනු ලබන්නේ විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යයේ ශේක්ෂ්පියර් වශයෙනි. ඒ ඔහු කෘතීන් 120 ක් තරම් වූ විශාල සංඛ්‍යාවක් ලියා තිබීම නිසා ම නොව, විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍ය නිසි විද්‍යාත්මක පසුබිමක් සහිත කතා කලාවක් බවට පත් කිරීම නිසා ය.

වෙල්ස් වැඩිදුර උගත්තෙක් නොවේ. සිය ප්‍රාථමික අධ්‍යාපනයෙන් පසු රැකියාවක් සොයා ගිය වෙල්ස් රෙදි වෙළෙන්දෙකු, ගුරුවරයකු, පුවත්පත් කලාවේදියකු ආදී වශයෙන් විවිධ රැකියාවල යෙදුණේ ය. මුලින් ම The Time Machineලියා විද්‍යා ප්‍රබන්ධකරුවකු වශයෙන් එළිදුටු වෙල්ස්, මහාචාර්ය තෝමස් හක්ස්ලි ගේ විද්‍යා දේශනවලට සවන් දීම නිසා සිය විද්‍යා දැනුම මුවහත් කර ගත්තේ ය. ඔහුගේ පසුකාලීන විද්‍යා ප්‍රබන්ධ ලිවීමේදී මෙම දැනුම ඔහුට බෙහෙවින් උපස්ථම්භක වූ බැව් කියනු ලැබේ.

වෙල්ස් විසින් ලියූ ඔහුගේ මුල්ම විද්‍යා ප්‍රබන්ධය වූThe Time Machine (1895) පසුව ආදර්ශ කතා වස්තුවක් වුණි. ඔහුගේ කෘතීන් 120 අතුරින් වඩාත් කැපී පෙනෙනුයේ The Island of Doctor Moreau (1896), The Invisible Man (1893), The War of the Worlds (1898), The First Turn on the Moon, Tuen Like Gods, War in the Air World Set Free ආදී කෘතීන් ය.

වර්න් අභ්‍යවකාශ ගමන් පිළිබඳව ලියූ කතාවේ කතා නායකයන් ගමන් කළේ අවකාශය දිග ය. එහෙත් වෙල්ස් නව අදහසක් ඉදිරිපත් කරමින් සිය කතානායකන් අවකාශය දිග නොව කාලය දිග දෙපසට (අනාගතයට සහ වර්තමානයට) ගමන් කැරවිය. ඔහුගේ The Time Machineනම් වූ මෙම මුල් කතාවට ලැබුණේ පවුම් 100 ක් තරම් වූ මුදලකැයි කියනු ලැබේ.

විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යයේ ප්‍රවර්ධනය උදෙසා වර්න්ගේ සහ වෙල්ස්ගේ කෘතීන් තදින් ම බලපා ඇති බව වර්තමාන විද්‍යා ප්‍රබන්ධකරුවන්ගේ කෘතීන් විමසා බැලීමේ දී පෙනීයන කරුණකි.

එහෙත් ගොතික සම්ප්‍රදයෙන් විද්‍යා ප්‍රබන්ධවලට උරුම වූ අද්භූත රාමුවෙන් බැහැර වීමට විද්‍යා ප්‍රබන්ධකරුවන්ට තව ම නොහැකි වී ඇත. අනාගතයේ දී ද ඉන් බැහැර වනැයි සිතිය නොහැකි ය. මක් නිසා ද යත්, අද්භූත සාධකය විද්‍යා ප්‍රබන්ධ සම්ප්‍රදයේ ද ජීවය වන හෙයිනි. එහෙත් විජ්ජාබලය, ගුප්ත විද්‍යා ආදියෙන් විද්‍යා ප්‍රබන්ධ සම්ප්‍රදය නිදහස් කිරීමට වෙල්ස් සමත් වී ඇත. 'මෙතෙක් ලියූ අද්භූත කතාවල අද්භූත සාධකය වූයේ විජ්ජා බලය යි. ෆ්‍රැන්කෙන්ස්ටීන් හි ද කෘත්‍රිම දැවැත්තයා පණ ගැන්වීම සඳහා ද විජ්ජාබලයට සමාන දෙයක් සොයා ගැනෙයි. මේ නිසා 19 වැනි සියවස අවසානයේ දී විද්‍යා ප්‍රබන්ධ කෙරේ පාඨකයාගේ වූ විශ්වාසය සහමුලින් ම නැති වී ගියේ ය. විජ්ජා හෝ භූත හෝ ප්‍රයෝග වෙනුවට විද්‍යාත්මක සත්‍යයන් යෙදීම මගින් පාඨකයා තුළ නැති වී ගිය විශ්වාසය යළි ඇති කළ හැකි යයි මට සිතිණ. ඉදින් මම විද්‍යා න්‍යායන්ට හැකි තරම් අනුකූල වන සේ මගේ කතා ලිවීමට මම උත්සහ ගතිමි.' පසු කලෙක වෙල්ස් ලියූවේ ය.

විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යයේ පියා වශයෙන්
ඇතැම් විචාරකයෝ සැලැකීමට කැමැති
වන එච්.ජී. වෙල්ස් උපන්නේ වර්න්ට
වසර 38 කට පසු එංගලන්තයේ ය.
බොහෝ විචාරකයන් වෙල්ස් හඳුන්වනු
ලබන්නේ විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යයේ
ශේක්ෂ්පියර් වශයෙනි.

විද්‍යා ප්‍රබන්ධ සෙසු ප්‍රබන්ධවලින් වෙන් කෙරෙන ප්‍රධාන සාධකය නම්, වෙල්ස් ඉහත ප්‍රකාශ කළ සේ විද්‍යා පසුබිම යි. 1929 දීScientific Wonder Storiesසඟරාවේ ප්‍රථම කලාපය නිකුත් කරමින් එහි සංස්කාරක හියුගෝ ගර්න්ස්බැක්, 'අප දන්නා විද්‍යා න්‍යායන් මත පදනම් වූ හෝ, එම න්‍යායයන් ඔස්සේ නිගමනය කළ නියමයන් හෝ පදනම් වූ කතා පමණක් නොව පළ කිරීම සඳහා ලැබෙන කතාවල විද්‍යාත්මක පසුබිම සෝදිසි කොට බැලීම සඳහා විශේෂඥ විද්‍යාඥයන් කණ්ඩායමක් ද ඔහු විසින් පත් කොට තිබුණු බැව් කියති.

මේ අනුව බලන විට, විද්‍යා ප්‍රබන්ධ ලේඛකයා හුදෙක් විද්‍යා දැනුමැති, නිර්මාණ කුසලතාවකින් යුත් සාහිත්‍යකරුවකු ද විය යුතු ය. විද්‍යා ප්‍රබන්ධකරුවන් දෙස බැලීමේ දී බොහෝ විද්‍යා ප්‍රබන්ධකරුවන් එවැන්නන් බව පෙනී යයි. කෙප්ලර්, වර්න්, වෙල්ස්, අයිසෙක්, ඇසිමෝ, බ්‍රියන් ඇල්ජීස්, ආතර්.සී. ක්ලාක් ආදීහු එවැන්නෝ වෙති. එපමණක් නොව ඔවුන් විද්‍යාව පිළිබඳ විෂය ග්‍රන්ථ පවා ලියූවෝ ද වෙති. වෙල්ස්ගේ ප්‍රථම ග්‍රන්ථය වූයේ A Text Book of Biology (1893)නම් විද්‍යා ග්‍රන්ථය යි. කෙප්ලර් ග්‍රහලෝක පිළිබඳ නියමයන් තුනක් ටයිකෝ බ්‍රෙහේගේ සටහන් බලා සකස් කළේ ය. ආතර් සී. ක්ලාක්'The Exploration of Space' ඇතුළු ග්‍රන්ථ සහ ලේඛන රැසක් ම ලියූවෙකි. අයිසෙක් ඇසිමෝ ද එවැන්නෙකි. ඔහු විසින් විවිධ මට්ටමේ පාඨකයන් සඳහා ලියූ විෂය ග්‍රන්ථ රැසකි. (යටත් පිරිසෙයින්) විද්‍යා ප්‍රබන්ධකරුවන් සුළු විද්‍යාඥයන් විය යුතු ය. යනුවෙන් විද්‍යා ප්‍රබන්ධ ලේඛකයන් ගැන කථා කිරීමේදී ආතර් සී. ක්ලාක් පවසා ඇත.

මනඃකල්පිත අද්භූත කතාවලට බොහෝ ඉඩකඩ ඇති අභ්‍යවකාශ තරණය සහ අන්තර් ග්‍රහලෝක ගමන් කවදත් විද්‍යා ප්‍රබන්ධකරුවන්ගේ ජනප්‍රිය අමුද්‍රව්‍ය විය. වෙනත් ලෝකවලින් එන එලියන්ස්ලා ගැනත්, ඔවුන් ගේ වාහනය යැයි ප්‍රචලිත වූ පියාඹන පීරිසි (නොහැඳිණු පියාසර වස්තුUFOs)ගැනත් කතා වඩ වඩාත් ලියැවෙන්නට විය. පියාඹන පීරිසි පිළිබඳ ආන්දෝලනය තදින් ම පැවැති 1950 ගණන්වලදී මෙම විෂය යටතේ ලියැවුණු කතා අති මහත් ය. දැනුදු මෙම විෂය ජනප්‍රිය ව පවතින බැවින් විද්‍යා ප්‍රබන්ධ කරුවන්ගේ අතින් ඒ ගිලිහී නැති බව අලුතින් පළ වී ඇති Consider Phlebas (-Iain M Banks)වැනි විද්‍යා ප්‍රබන්ධ වලින් පෙනී යයි. ආතර් සී ක්ලාක් ගේChildhood's End මේ යටතේ ලියැවුණු සියලූ ම විද්‍යා ප්‍රබන්ධ අතුරින් අග්‍රගණ්‍ය කෘතියකි.

එහෙත් අලුත් ම ප්‍රවණතාව ඇති වී ඇත්තේ අඟහරු ලොවට යන ගමන් සහ එම ග්‍රහයා මත ජනාවාස ඇති කිරීම යි. හඳ තරණයෙන් පසු ඊළඟ ඉලක්කය අඟහරු ලොව බව නාසා ආයතනය මගින් නිවේදනය කිරීමෙන් පසු අඟහරු ගමන් ගැන වැඩි වැඩියෙන් ප්‍රබන්ධ ලියැවෙන්නට විය.

විද්යුත් පරිගණක අළලා විද්‍යා ප්‍රබන්ධ ලිවීමට ආතර් සී. ක්ලාක් ගේ 2001 Aspace Odysseyහි 'හල්' නම් අභ්‍යවකාශගාමී පරිගණකය ඉවහල් වූවා නිසැක ය. චෙකොස්ලෝවැකියානු ලේඛකයකු වූ කරෝල් කපෙක් 1921 දී සිය රටේ වේදිකාගත කළ නාට්‍යයක(Rossum's Universal Robots RUR) නිර්මාණය කළ රොබෝවරු පසු කාලයක විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යයේ මෙන් ම තාක්ෂණයේ රොබෝ සංස්කෘතියක් බිහි කිරීමෙහි ලා ඉවහල් විය. ඔහු මැවූ කෘත්‍රිම මිනිසුන් සඳහා 'වැඩ' යන අරුතින් 'රොබෝ' යන පදය පවා තනන ලද්දේ කපෙක් විසිනි. අයිසෙක් ඇසිමෝ බොහෝ විට සිය ප්‍රබන්ධවලට පාත්‍රකොට ගත්තේ මේ රොබෝවරු ම ය.

කපෙක් සිය නාට්‍යයෙන් ඉදිරිපත් කළ කෘත්‍රිම මිනිසුන් සැබෑ මිනිස් සමාජය සමූල ඝාතනය කරන සැටි නිරූපනය කොට පෙන්වමින් විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍ය මව් කෘතියේ තේමාව යළින් මතුකොට පෙන්වූයේ ය.

1980 ගණන්වලදී විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍ය පුරා නව රැල්ලක් නැගිණ. ඒ 'සයිබර්පන්ක්' නම් වූ රැල්ල යි. සත්ත්ව සහ යාන්ත්‍රික ස්වයංක්‍රියතාව සහ සන්නිවේදනය සයිබනිතික විද්‍යාව නම් වූ වදනින් තද්භව ව ආ මේ වදනින් 'සත්ව සහ යාන්ත්‍රික ස්වයංක්‍රියතාවයේ විප්ලවය' යන අරුත් දෙයි. මෙම රැල්ලේ ගැඹුරු තේමාවන් වී ඇත්තේ මිනිස් මොළය සහ විද්‍යුත් පරිගණක අතර අන්තර් ක්‍රියාකාරීත්වයත් සංනිවේදනය සහ කෘත්‍රිම බුද්ධිය වැනි දෑ ය. එපමණක් නොව කෘත්‍රිම මොළයක් බිහි කිරීම සහ රොබෝවරුන් විසින් ම, පරිණාම වන සුළු ස්වභා ඇති රොබෝවරුන් නිර්මාණය කිරීමට ඊට ඇතුළත් වේ.

විද්‍යා ප්‍රබන්ධකරුවන් ම පවසන පරිදි අනාගතයේ ඇතිවිය හැකි අධි සූක්ෂම තාක්ෂණයේ ප්‍රතිඵලය විය හැක්කේ පොළොව මත ව්‍යාප්ත වන රොබෝ ශිෂ්ඨාචාරයකි. එසේ නම් වර්තමානයේ පවත්නා ප්‍රබන්ධ සාහිත්‍යයේ තාත්වික සම්ප්‍රදාය නවදූරටත් පවතී ද යනු සැකයෙකි. එසේ ම තාත්වික සාහිත්‍යයක් රස විඳිය හැකි මිනිසුන්ගේ සංඛ්‍යාව අල්ප වෙමින්, රොබෝවරුන් ගේ සංඛ්‍යාව අධික වන හෙයින්, අනාගත ප්‍රබන්ධ රස විඳින්නෝ රොබෝවරුන් විය හැකි ය. එසේ නම් අනාගත ප්‍රබන්ධකරුවන් ද වීමේ ප්‍රවණතාව ඇත්තේ රොබෝවරුන්ට ම ය. රොබෝවරුන් විසින් කෙරෙන සාහිත්‍යයන් කොහෙත් ම තාත්වික විය නොහැකි හෙයින් එය නිතැතින් ම අද්භූත විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යයක් විය හැකි ය. එනම් වර්තමාන විද්‍යා ප්‍රබන්ධ කාලවේ ම ඉදිරි පියවරක් විය හැකි ය. එවිට සමස්ථයක් වශයෙන් මුළු ලෝකයේ ම සාහිත්‍යය විද්‍යා ප්‍රබන්ධ කලාව පදනම් කරගත් සාහිත්‍යයක් විය නොහැකි ද?

එහෙත් විසිඑක්වන සිය වස දක්වා වූ කාල පරිච්ඡේදය හුදෙක් විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යයේ අවකාශය සහ කාල පිළිබඳ ඉතිහාසයේ නවත් කාල පරිච්ඡේදයක් පමණි. මක් නිසා ද යත් ආතර් සී. ක්ලාක් ගේ හැටියට 'ප්‍රමාණවත් දියුණුවක් ඇති තාක්ෂණයත්, ගුප්ත විද්‍යාවේ ක්‍රමවේදයත් අතර වෙන් කොට දැක්විය හැකි වෙනසක් නොවන හෙයිනි.' ❑